| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය | | | |
| ශ්‍රේණිය 11 | විෂය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය: I | කාලය: පැය 01 යි |

සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න.

- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයන්හි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

---

(01) සමහර අය **හිතක් පපුවක් නැති ලෙස** කටයුතු කරති.
(1) සානුකම්පිත (2) අනුකම්පා රහිත (3) ඕනෑවට එපාවට (4) එක සිතින්

(02) රටේ පවතින වාතාවරණය හමුවේ බොහෝ පිරිස් **මඩිය තර කරගැනීමට** වෙහෙසෙති.
(1) බඩු රැස්කර ගැනීමට (2) ගේ දොර විශාල කර ගැනීමට
(3) අනිසි ලෙස ලාභ ගැනීමට (4) මුදල් උපයා ගැනීමට

(03) විවිධ රෝගී තත්ත්වයන් **නිට්ටාවට ම** සුව කිරීමට වෛද්‍යවරු මහත් වෙහෙසක් දරති.
(1) ටිකෙන් ටික (2) පටන් ගැන්මෙන් (3) පැතිර යද්දී (4) සහමුලින් ම

- අංක 04 සිට 06 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

(04) ජීවිතයට සිදුවන කරදරවලින් මිදීමට ඇතමෙක් ............................ ක්‍රම හා විධි කෙරෙහි පෙළඹී ඇත.
(1) ආගමික (2) ආධ්‍යාත්මික (3) තාක්ෂණික (4) භෞතික

(05) කවියා නිරන්තරයෙන් රසවත් නිර්මාණ සඳහා ............................... වලින් පරිපෝෂිත වාං මාලාවක් භාවිත කරයි.
(1) නිශ්චිතාර්ථ (2) වාච්‍යාර්ථ (3) ව්‍යංග්‍යාර්ථ (4) සංශයාර්ථ

(06) ජාතීන් අතර ....................... බැඳීමක් පැවතීම යුගයේ අවශ්‍යතාවකි.
(1) ආකර්ෂණීය (2) අවියෝජනීය (3) ප්‍රේමණීය (4) ඓන්ද්‍රීය

(07) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව ඇති පද පේළිය තෝරන්න.
(1) රිද්මානුකූල, දුරස්ථ, ප්‍රත්‍යාර්ථ, ප්‍රාසාංගික
(2) ගුරුමුෂ්ටිය, ඊර්ෂ්‍යාව, නෂ්ටාවශේෂ, දෝෂාභියෝගය
(3) අවලෝකිතේශ්වර, ක්ෂේත්‍රඵලය, කුම්භස්ථල, ශාස්ත්‍රඥ
(4) නළඟන, දේපල, තිප්පිළි, සොලොස

(08) නිරුපද්‍රිත, ආශ්‍රම, ප්‍රකෘති, විරැකියා යන වචනවල **දෙවෙනි** අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කෙටි ඇදය, රකාරංශය, ගැටය සහිත ඇලපිල්ල, කෙටි පාපිල්ල
(2) කෙටි පාපිල්ල, ගැටය සහිත ඇලපිල්ල, රකාරංශය, කෙටි ඇදය
(3) කෙටි පාපිල්ල, රකාරංශය, ගැටය සහිත ඇලපිල්ල, කෙටි පාපිල්ල
(4) කෙටි පාපිල්ල, රකාරංශය, ගැටය සහිත ඇලපිල්ල, කෙටි ඇදය

(09) 'දණ' යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,

(1) අඝෝෂ (2) නාසික්‍ය (3) ඝෝෂ (4) අල්පප්‍රාණ

(10) අකාරාදී පිළිවෙළ **නිවැරදිව** දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) මීරිගම, මාතර, මහනුවර, මෝදර
(2) පල්ලිය, පාසල, කෝවිල, දේවාලය
(3) අපේගම, කළුවරගෙදර, ගම්පෙරළිය, යුගාන්තය
(4) චිරන්තන, ජාත්‍යන්ධ, නිර්ණාමික, ඒකායන

(11) උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් ඇති වරණය තෝරන්න.

(1) මා, අපි, දරුවන්, සිටාණන් (2) දූරියක්, මවක්, සමහරු, ඇතැමෙකු
(3) ඕතොමෝ, මැණියෝ, ගායකයා, රියදුරන් (4) ඔවුහු, අප, පැටවෙකු, කිරිල්ලියක්

(12) පබාවතිය '<u>පොකුණෙහි</u>' මල් දැක ප්‍රීති වූවාය. යන වාක්‍යයෙහි පොකුණෙහි යන පදය අයත් විභක්තිය වන්නේ,

(1) ආලපන (2) ආධාර (3) අවධි (4) කර්ම

(13) සංවර්ධනය යන පදයෙහි 'සං' යනුවෙන් යෙදෙන්නේ,

(1) උපසර්ගයකි. (2) තද්ධිතයෙකි. (3) නිපාතයකි. (4) කෘදන්තයෙකි.

(14) 'මුවතඹර' යන්න අයත් වන්නේ,

(1) දකාරාර්ථ සමාසයට (2) විභක්ති සමාසයට
(3) අන්‍යාර්ථ සමාසයට (4) විශේෂණ සමාසයට

(15) කෘදන්ත පදයක් යෙදී ඇති වාක්‍ය තෝරන්න.

(1) අපි මිහිරි ගීත ගයමු.
(2) නංගී රැඟුම් පාමින් සතුටු වෙයි.
(3) සමහරුන් යද්දී ඇතැමෙක් බලා සිටිති.
(4) ඇගේ මිහිරි ගීතරාවය කන් පිනවීය.

(16) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) සන්ධි - වක්කත්ත, යනෙන, වන්නම්, තියුණු
(2) අසම්භාව්‍ය ක්‍රියා - පායත්, බසිත, පිරුණොත්, වැටෙත්
(3) උපසර්ග - අදියර, පරිමාණ, දැසිදසුන්, ප්‍රතිලාභ
(4) කෘදන්ත - කැපීම්, පිසිලි, කියවිලි, ලියනු

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(17) අතීතයේ බොහෝ භික්ෂූන් වහන්සේලා **ප්‍රාචීන භාෂා** රාශියක දැනුමෙන් යුතුව ග්‍රන්ථ පරිශීලනය කළහ.

(1) අපරදිග භාෂා (2) පෙරපරදිග භාෂා (3) පාලි භාෂා (4) පෙරදිග භාෂා

(18) ගැටලුවක් ඇති වූ විට යම්කිසි **සම්මුතියකට** එළඹීමෙන් ඒවා විසඳාගැනීමට හැකි වේ.

(1) එකඟතාවයක් (2) විසඳුමක් (3) සාකච්ඡාවක් (4) තීරණයක්

(19) බොහෝ **<u>අදෘශ්‍යමාන</u>** බලවේග මගින් ලෙඩ රෝග සුව කරගැනීමට බොහෝ දෙනා වෙහෙසෙති.
(1) අව්‍යාජ (2) ව්‍යාජ (3) අන්තර්ධාන (4) අඥාන

(20) දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් බැඳී **<u>නොපවත්නා</u>** පද පේළිය තෝරන්න.
(1) තද්ධිත, සමාස, කෘදන්ත, විභක්ති (2) පූර්ව, මිශ්‍ර, අසම්භාව්‍ය, විධි
(3) යළි, නිසා, බැවින්, සමඟ (4) පරදේශ, පිළිසරණ, පාෂ්ටිමත්, සදොස්

(21) එක් එක් පද පේළියේ දී ඇති පදවල සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) සමය - වකවානුව, මොට - අඥාන, දුගී - දිළිඳු, සිලුටු - කටුක
(2) ඉන්ද්‍රචාප - දේදුනු, විල - සර, ගුවන - අඹර, වණ - ආලේප
(3) පිළිරුව - අනුරුව, උදක - පැන්, රූක්ෂ - සැර, සතුට - දුක
(4) රීතිය - නීතිය, සිඳු - රුවනාර, ප්‍රජාව - වර්ගයා, බඳු - වැකි

(22) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **<u>නොදෙන</u>** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) වෑයම - උත්සහය, යත්න, ප්‍රයාශය, වීර්යය
(2) ධවල - හෙළ, ශ්වේත, ඇළි, අවදාත
(3) ගෘහය - විමන, මැදුර, ගෙය, ගෘහය
(4) අව්‍යාජ - ඍජු, අවංක, බොරු, අකුටිල

(23) විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) සරණ - නිස්සරණ (2) තුමුල් - අල්ප (3) කොවෙ - කුඩා (4) අදාන්ත - දාන්ත

(24) A - වෛද්‍යවරු දෙවියන් ...................... කටයුතු කරති.
B - කුරුල්ලන් ........................ සන්දේශ යැවූ බව සඳහන් වේ.
C - සෙබළ රට ජාතිය ............................ සිය ජීවිත පරිත්‍යාග කරති.
D - මව්පියෝ තම දරුවන් .............................. වෙහෙසෙති.
ඉහත වාක්‍යවල හිස්තැන් කිරීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙල වන්නේ,
(1) උදෙසා, ගැන, මෙන්, මගින් (2) මෙන්, මගින්, උදෙසා, ගැන
(3) මගින්, මෙන්, උදෙසා, ගැන (4) උදෙසා, ගැන, මගින්, මෙන්

(25) **<u>වැරදි</u>** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) ච, ෆ අක්ෂර ද්විජාක්ෂර වේ.
(2) බලනු, ලදහ යනු කර්මකාරක අතීත කාල බහුවචන ආඛ්‍යාතයකි.
(3) තිනෙත් යනු විභක්ති සමාසයකි.
(4) සෙඳ යනු ශීඝ්‍රාර්ථයේ යෙදෙන නිපාතයකි.

(26) පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නගර නාමය ඇතුළත් වරණය තෝරන්න.
(1) මණ්ඩිමාරව (2) ඩියතණ්නාත් (3) යහිමගන (4) සමහාරාස්තිස

(27) පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) ලෝකය සමඟ දියුණු තාක්ෂණයේ ගම්මානයක් එකම වී ඇත.
(2) පරිකල්පන ශක්තිය නිර්මාණකරුවන් මත සතු නිර්මාණ අපූරු බිහිවේ.
(3) ලෝකය අනාගත ජයගැනීමට අධ්‍යාපන යුතුය ලැබිය නිවැරදිව
(4) රට වැසියන් වෙනුවෙන් සියලු පහසුකම් සැළසීමට රජය බැඳී සිටියි.

- අංක 28,29 ප්‍රශ්න යටතේ දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

(28) ජන්ම ගති වෙනස් කිරීම අපහසු වේ.

(1) කටුස්සගේ කරේ රන් බැන්දා වගෙයි. (2) උපන්ගෙයි සිරිත බලි ඇරියත් නැරේ.

(3) කොටියගේ පුල්ලි මකන්ට බැරිවීම (4) අබරා සිල් ගත්තා වගෙයි.

(29) කලාතුරකින් යම්කිසි දෙයක් සිදුවීම.

(1) ඉබ්බගෙන් පිහාටු ඉල්ලීම. (2) සඳුන් වෙනෙත් උරුලැවන් ඇත.

(3) කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බැලීම. (4) ගුරුන්ටත් අකුරු වරදී.

(30) වක්කත්ත, දුටුවෙක් යන පද අයත් සන්ධි වර්ගය පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

(1) ද්විත්ව රූප සන්ධිය - ස්වර සන්ධිය

(2) පූර්වස්වර ලෝප සන්ධිය - පරස්වර ලෝප සන්ධිය

(3) ආගම සන්ධිය - ද්විත්ව රූප සන්ධිය

(4) ද්විත්ව රූප සන්ධිය - ආගම සන්ධිය

(31) A - අවගුණ - තද්ධිත

B - තුදුස් - දාහතර

C - ගොවියාට - සම්ප්‍රදාන විභක්තිය

D - ලැබේවා ! - විධික්‍රියා

ABCDඅතුරින් නිවැරදි වන්නේ,

(1) BC (2) AC (3) ABC (4) BCD

- අංක 32, 33 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

(32) (1) සභාතුමු සතුටින් විසිර ගියහ.

(2) දරුවන් කැටුව මව ගමට යති.

(3) ඔවුන් විසින් කටයුතු සම්පාදනය කරනු ලබති.

(4) අලියා නොහොත් හස්තියා වනයේ රජා වෙයි.

(33) (1) විදුහල්පතිනියක් වූ ඇය ලේඛිකාවක් ද වූවා ය.

(2) ධජ සමූහය නගර අලංකාර කරති.

(3) අප ක්‍රීඩා කරති'යි ගුරුවරු සිතති.

(4) සමහරු දක්ෂ නළුවන් වෙති.

(34) වක්කඩ බඳිමු, වැහි වලාකුළ, ගම අමතකයි, අලුත ගෙනා මනාලිය යන නිර්මාණවල නිර්මාණකරුවන් වන්නේ,

(1) ජී.බී.සේනානායක, මහගමසේකර, ගුණදාස අමරසේකර, කුමාරතුංග මුනිදාස

(2) ගුණදාස අමරසේකර, කුමාරතුංග මුනිදාස, මහගමසේකර, ජී.බී.සේනානායක

(3) මහගමසේකර, කුමාරතුංග මුනිදාස, ගුණදාස අමරසේකර, ජී.බී.සේනානායක

(4) කුමාරතුංග මුනිදාස, ජී.බී.සේනානායක, මහගමසේකර, ගුණදාස අමරසේකර

(35) පහත සඳහන් කවියේ සිව්වන පදය තෝරන්න.

එගොඩ ගොඩේ උල ලේනා අඬන්නේ
මෙගොඩ ගොඩේ මම සීපද කියන්නේ
දෙගොඩහරිය ගෙවිලා පිනි වැටෙන්නේ
..............................................................................

(1) හීනෙන් ඇවිත් නෑනා අත වනන්නේ
(2) රෑ තිස් පැයේ පැල් රැක නිදි මරන්නේ
(3) දෙගොඩ ගොඩින් කොතැනද නුඹ සිටින්නේ
(4) හේනෙ කඩුල්ලට එපිටින් සිටින්නේ

(36) මයූර සන්දේශය ලියා ඇත්තේ යැයි සැලකෙන්නේ,
(1) තොටගමුවේ රාහුල හිමි
(2) වීදාගම මෛත්‍රී හිමි
(3) වැත්තෑවේ හිමි
(4) කවිශ්වර නම් පඬිවරයෙක්

(37) ආචාර්ය ජයලත් මනෝරත්නයන්ගේ නිර්මාණයක් නොවන්නේ,
(1) ගුරු තරුව (2) තලමල පිපිලා (3) රත්තරන් (4) සඳගිර

(38) ගිනි යාදින්න පවත්වන්නේ,
(1) කුඹල් කර්මාන්තයේ දී
(2) පතල් කර්මාන්තයේ දී
(3) කුඹුරු ගොවිතැනේ දී
(4) හේන් ගොවිතැනේ දී

(39) මුදු ගුණය ඇති අය
දරුවන් දිනිය යුතු වෙය
ගොවිදන මනා වූ
දිනිය යුතු වූ සේම ගම්බිම්

මේ කොටස උපුටාගෙන ඇත්තේ,
(1) හුණුවටය නාට්‍යයෙන්
(2) තලමල පිපිලා නාට්‍යයෙන්
(3) තොරොක්කෝව කතාවෙන්
(4) වතුරමල කතාවෙන්

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට **<u>වඩාත් සමීප</u>** අදහස දෙන වරණය තෝරන්න.
මහින්දාගමනය දිවයිනේ ආගමික ඉතිහාසයේ මෙන්ම සමාජ ආර්ථික හා සංස්කෘතික සන්ධිස්ථානයක් වේ.
(1) සමාජ ආර්ථික සංස්කෘතික ක්ෂේත්‍රයේ සන්ධිස්ථානය මහින්දාගමනයයි.
(2) දිවයිනේ සියලු ම දෑ මහින්දාගමනය නිසා ලැබී ඇත.
(3) සමාජ ආර්ථික, සංස්කෘතික, ආගමික ඉතිහාසයන්හි සන්ධිස්ථානයක් වූයේ මහින්දාගමනයයි.
(4) මිහිඳු හිමියන්ගේ පැමිණීමෙන් ආගමික ඉතිහාසයට සන්ධිස්ථානයක් ලැබුණි.

(ලකුණු 40)

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020

උපකාරක ප්‍රශ්න පත්‍රය

| ශ්‍රේණිය 11 | විෂය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය: II | කාලය: පැය 02 යි |
|---|---|---|---|

සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න.

(01) (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) හද (ආ) හඳ

ii. ඔ ත ඖ ම උ ෆ ව
උත්පත්ති ස්ථාන අනුව ඉහත අක්ෂර අතරින්
(අ) දන්ත ඕෂ්ඨජ අක්ෂර (ආ) කණ්ඨ ඕෂ්ඨජ අක්ෂර ලියන්න.

iii. පහත වාක්‍යයේ ඇති තද්ධිත හා කෘදන්ත පද උපුටා දක්වන්න.
ඉන්දියානු නර්තන ශිල්පීන්ගේ නැටුම්වලින් පිරිස සතුටු වූහ.

iv. පහත වාක්‍යවල කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති ලියන්න.
(අ) සිසුහු **බසයෙන්** බැස පාසලට ගියෝ ය.
(ආ) දෙමව්පියෝ **දරුවන් උදෙසා** වෙහෙසෙති.

v. පහත පද විසන්ධි කර සන්ධි නාමය ලියන්න.
(අ) අනුරුත් (ආ) නාරම්මල

vi. පහත සඳහන් වාක්‍ය සදොස් ය. නිදොස් කර ලියන්න.
(අ) මිනිස්සු රට පිළිබඳ නො සිතෙන්නේ ඇයි?
(ආ) ගුරුවරු නොහොත් අධ්‍යාපනඥයින් රටේ අධ්‍යාපන කටයුතු නගා සිටුවති.

vii. පහත සඳහන් යෙදුම්වල පළමුවැනි හෝ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කරන්න.
(අ) අනර්ඝ බිම (ආ) කලණ මිත්‍ර

viii. පහත සඳහන් අදහසට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
(අ) තීරණයක් ගැනීමට අපහසු වී සිටින (ආ) වියදම් අවම කරගනිමින් කටයුතු කිරීම.

ix. පහත සඳහන් පරිමිත භාෂා සඳහා පොදු ව්‍යවහාර ලියන්න.
(අ) කුටාලම (ආ) අළුපොළ

x. පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයටත්, කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයටත් හරවන්න.
(අ) ඔවුහු අප පිනවමින් ගීත ගැයූහ. (ආ) දූරියක විසින් මවක් පෝෂණය කරනු ලබයි.

(ලකුණු 2 X 10 = 20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරින් **එකක්** තෝරා ගෙන වචන **250 කට නොඅඩු වන සේ** රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අපට අතීතයේ සිට උරුම වූ උතුම් සාරධර්ම ගුණධර්ම බොහෝ ය. මිනිසුන් එකිනෙකා අතර පැවති සබඳතාවය ශක්තිමත් වූයේ මේ නිසා ය. නමුත් නූතනත්වය සමඟ බටහිර නාගරීකරණය වෙත යොමු වන විට ක්‍රමයෙන් සාරධර්ම පිරිහී ගිය සමාජයක් ගොඩනැඟෙන්නට විය. බොහෝවිට මිනිසුන් නොමිනිසුන් ලෙස කටයුතු කිරීමට යාමෙන් හිංසා පීඩා ආදී අයහපත රජ කරන බව දක්නට ලැබේ. නමුත් ජාතියක් ලෙස නැගී සිටීමට නම් එකිනෙක අතර ගුණධර්ම සාරධර්ම වැඩි දියුණු වීම අත්‍යවශ්‍ය වේ. මේ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ) මෑතදී බෝ වන, බෝ නොවන රෝග ව්‍යාප්තිය මුළු ලෝකය පුරාම දක්නට ලැබේ. ඒ අතර Covid 19 හෙවත් කොරෝනා රෝගය බෝ වන රෝගයක් ලෙස පැතිරී යයි. මේ රෝගය වැළඳී මිය ගිය සංඛ්‍යාව අධික වේ. ලෝකයේ බලවත් රාජ්‍යයන් වන ඇමරිකාව, චීනය, බ්‍රිතාන්‍ය පමණක් නොව සෑම රටක ම විශාල ලෙස මෙම රෝගයට ගොදුරුවීම දක්නට ලැබේ. මෙම රෝගයට ගොදුරු වීමේ දී මිනිසුන්ගේ නොසැලකිලිමත් බව හේතු වූ අතර රෝගය වළක්වා ගැනීමටත් වැළඳුන අය බේරා ගැනීමටත් අපේ මේ පුංචි රට තුළ නොකළ දෙයක් නැත. ජාතියක් ලෙස නැගී සිටිමින් ත්‍රිවිධ හමුදාව රටේ පාලන තන්ත්‍රය සමඟ එකමුතු වීම දක්නට ලැබුණි. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වූ සියලු දෙනාම සිහිපත් කළ යුතු වේ.

(ඉ) පාසල් අධ්‍යාපනයෙන් පසු සීමිත පිරිසක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා යොමු වේ. උසස් අධ්‍යාපනයෙන් පසු එයින් ඉහළ ප්‍රතිඵල ලබා ගන්නේ තවත් සීමිත පිරිසකි. නිදහස් අධ්‍යාපන ක්‍රියාවලිය යටතේ ඉගෙනුම ලබන මේ පිරිස නිසි පරිදි අධ්‍යාපනය ලබා ගන්නවා ද? විශ්ව විද්‍යාල අධ්‍යාපනය තුළ බොහෝ විට අසන්නට ලැබෙන්නේ විප්ලව, උද්ඝෝෂණ, නවකවදය, ඉල්ලීම් ආදී ගැටලු සහගත දේවල් ය. රජය විශාල ලෙස මුදල් වියදම් කර විශ්වවිද්‍යාල මගින් උගතුන් බිහි කිරීමට වෙර දරද්දී ඔවුන් විවිධ අයිතිවාසිකම් ඉල්ලමින් හැසිරෙන අතර තම යුතුකම වගකීම වූ හොඳින් අධ්‍යාපනය ලබා තම රටට වැඩක් කිරීම අමතක කර ඇත. රටේ සංවර්ධනයට මේ තත්ත්වය බලපානු ඇත. එබැවින් මේ පිළිබඳ දැඩි ලෙස අවධානය යොමු කළ යුතු කාලය පැමිණ ඇත.

(ඊ) ශ්‍රී ලංකාව ස්වභාව සෞන්දර්යයෙන් අනූන රටකි. උණුසුම්, ශීතල දේශගුණය සමසමව ලබාදෙන රටක් නිසා සංචාරකයෝ නිරන්තරයෙන් ඇදී එති. මේ පිරිස මුහුදු වෙරළ ආශ්‍රිතවත් රට අභ්‍යන්තරයේ විවිධ ස්ථානවලට ඇදී යති. විදේශිකයින්ගේ පැමිණීම ආර්ථික වශයෙන් රටට දියුණුවක් ලබා දේ. සංචාරකයන්ගේ පැමිණීම මෑත කාලීනව ඇති වූ විවිධ හේතු මත අවම වී ඇත. මේ නිසා ඔවුන්ට ඇතිවන ගැටලු අවම කිරීමටත්, රටේ ආරක්ෂාව මෙන්ම විදේශිකයන්ගේ ආරක්ෂාව ඇති කිරීමටත් කටයුතු සංවිධානය කළ යුතු ය. එසේ වුවහොත් සංචාරක ව්‍යාපාරය මගින් අප රටට ලැබෙන ආර්ථික දියුණුව වර්ධනය වනු ඇත.

(ලකුණු 25)

(03) පහත දැක්වෙන පාඨය **වචන 50 - 55 අතර වනසේ** සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

කවියාත්, නවකතාකරුවාත්, කෙටි කතාකරුවාත්, නාට්‍ය රචකයාත් සිය අත්දැකීම් ප්‍රකාශමාන කිරීම සඳහා උචිත ධ්වනිතාර්ථ නගන භාවිත ගුණයෙන් හෙබි භාෂාවක් උපයෝගී කර ගන්නා බැව් පැහැදිලි කරුණකි. එසේ වුවත් සෙසු සාහිත්‍යකරුවන්ට වඩා කිසියම් සූපරීක්ෂාකාරීත්වයකින් යුතුව වචන තෝරා ගැනීමට කවියාට සිදු වී ඇත. ඊට හේතුව පද්‍ය රචනයක සාර්ථක අසාර්ථකභාවය බොහෝ දුරට රඳා පවතින්නේ කවියා විසින් උපයෝගී කරගනු ලබන භාෂා මාධ්‍ය මත බැවිනි. නවකතාවක කෙටිකතාවක හෝ නාට්‍යයක උපයුක්ත භාෂාවෙහි ධ්වනි ශක්තිය කිසියම් ප්‍රමාණයකින් හීන වුවද සාහිත්‍ය නිර්මාණයෙහි අගය නිර්මාණයෙහි ලා එය බාධාවක් නොවේ. භාෂාව උචිත ගුණයෙන් හීන වුවද, සාහිත්‍ය කෘතියෙහි නිරූපිත අත්දැකීම්, චරිත නිරූපණය, සන්දර්භමය ශිල්පීය ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීමෙන් එම කෘතිය කිසියම් ප්‍රමාණයකින් අගය කළ හැකිය. එහෙත් පද්‍ය රචනයක අත්දැකීමට නියම වශයෙන් ප්‍රවේශ විය හැක්කේ කවියා, උපයුක්ත වචන මාලාව කෙරෙහි ප්‍රතිචාර දැක්වීමෙන් ම පමණි. කවියා විසින් යොදා ගනු ලැබ ඇති වචන මාලාව, භාවිත ගුණයෙන් හීන නම් කවියාට විෂය වූ අත්දැකීම් පාඨකයාට ප්‍රතිනිර්මාණය කළ නොහැකිය. එයට සමවැදීමට නොහැකිය. මේ නිසා නවකතා, කෙටි කතා වැනි සාහිත්‍ය මාධ්‍යයන්ට වඩා, කාව්‍ය මාධ්‍යයෙහි උපයුක්ත භාෂාව වඩාත් වැදගත් වන්නේ ය.

රසික හදෙහි භාව ප්‍රබෝධයක් ඇති කරනු සමත්, ධ්වනි පූර්ණ භාෂා මාධ්‍යයක් සකස් කර ගැනීමේදී කවියා, විවිධ භාෂා ක්ෂේත්‍රවලින් ආභාසයක් ලැබීමට උත්සුක වෙයි. මෙහිදී ඔවුහු බොහෝ විට පැරණි කාව්‍ය භාෂාව කෙරෙහි දැඩි අවධානයක් යොමු කරති.

(ලකුණු 10)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ඈත අතීතයේ සිට මනුෂ්‍යයන් විවිධාකාර සන්නිවේදන ක්‍රම උපයෝගී කරගෙන ඇති අයුරු මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ ඉතිහාසය පිරික්සීමේදී පෙනේ. සන්නිවේදනය යනු කිසිවකු විසින් කිසියම් අදහසක් අන්‍යයන්ට දැනුම් දීමයි. මනුෂ්‍ය ශිෂ්චාරයේ මුල් අවධියේදී මෙන් ම අදත් මේ කටයුත්ත විවිධාකාරයෙන් සිදු වේ. උදාහරණ වශයෙන් ලංකාවේ ජනතාව අතර පැවති එක් සිරිතක් නම් කිසියම් වැදි පිරිසකට අයිති යැයි සලකන ලද ගොදුරු බිම් වෙත අන්‍යයන් ඒම වැළැක්වීම සඳහා, එනම් එම ගොදුරු බිම තමන් සතු බව අන්‍ය වැදි පිරිස්වලට දැනුම්දීම සඳහා යම් යම් ප්‍රකට ස්ථානවල සලකුණු සඳහන් කිරීමයි. මෙහි දී නියමිත මායිම්වල පිහිටි ගස් කඳන් මත කිසියම් සංකේතයක් කොටන ලදී. මෙවැනි අවස්ථාවකින් පැහැදිලි වන්නේ කිසියම් පණිවුඩයක් සන්නිවේදනය කිරීම සඳහා දෘශ්‍යමය සංකේතයක් යොදා ගැනුණු ආකාරයයි.

මෙබඳු තවත් ප්‍රාකෘතික සන්නිවේදන ක්‍රමයකි භේරි සංඥාව. විවිධාකාර බෙර තාල අනුව ඒ ඒ තාලය හා සම්බන්ධ අදහස් ඈතට දැක්විය හැකිය. අප්‍රිකාවේ ඇතැම් ගෝත්‍රිය ජනතාවන් අතර මෙබඳු භේරි සංඥා ක්‍රම භාවිත වූ සැටි අපි අසා ඇත්තෙමු. යුද්ධයක් හෝ ආක්‍රමණයක්, නැතහොත් ඉක්මනින් ඈත සිටින්නන්ට දැන්විය යුතු වෙනත් කාරණයක් සන්නිවේදනය කිරීම සඳහා ඉතාම කාර්යක්ෂම මාධ්‍යයක් හැටියට භේරි සංඥා ක්‍රමය සැලකිය හැකිය. තවමත් අපේ ගම්වල මරණයක්, දානයක්, පිරිතක්, විවාහ මංගල්‍යයක් ගැන ගමට, රටට දැනුම් දෙනු ලබන්නේ බෙර හේවිසි, රබන් ආදී භේරි සංඥා උපක්‍රම මගිනි.

(i) සන්නිවේදනය යනුවෙන් මෙහි සඳහන් වන්නේ කුමක් ද?

(ii) වැදි ජනතාව අන් අයට තමන් සතු දෙයක් දැන් වූ ආකාරය මෙහි දැක්වෙන්නේ කෙසේ ද?

(iii) මෙම ඡේදයේ දැක්වෙන තවත් ප්‍රාකෘතික සන්නිවේදන ක්‍රමයක් දක්වන්න.

(iv) අප්‍රිකානුවෝ ඉහත සඳහන් සන්නිවේදන ක්‍රමය භාවිත කළ අවස්ථාවක් දක්වන්න.

(v) වර්තමාන ගැමි ජීවිතයේ පැරණි සන්නිවේදන ක්‍රම භාවිත කරමින් දැනුම් දෙන අවස්ථා 02 ක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(ලකුණු 20)

## සිංහල භාෂාව හා සාහිත්‍යය

## පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 4 | 21. | 2 | 31. | 1 |
| 2. | 3 | 12. | 2 | 22. | 4 | 32. | 1 |
| 3. | 4 | 13. | 1 | 23. | 3 | 33. | 3 |
| 4. | 2 | 14. | 4 | 24. | 2 | 34. | 2 |
| 5. | 3 | 15. | 2 | 25. | 3 | 35. | 3 |
| 6. | 2 | 16. | 3 | 26. | 2 | 36. | 4 |
| 7. | 3 | 17. | 4 | 27. | 4 | 37. | 3 |
| 8. | 4 | 18. | 1 | 28. | 2 | 38. | 4 |
| 9. | 3 | 19. | 3 | 29. | 3 | 39. | 1 |
| 10. | 3 | 20. | 4 | 30. | 4 | 40. | 3 |

(ලකුණු 40)

### II පත්‍රය

(01) i. (අ) හෘද වස්තුවට අදාළ උක්තාඛ්‍යාත නිවැරදි වාක්‍යයක්
(ආ) චන්ද්‍රයාට අදාළ උක්තාඛ්‍යාත නිවැරදි වාක්‍යයක්

ii. (ආ) ච ෆ (ආ) ඔ ඖ

iii. ඉන්දියානු , නැටුම්

iv. (අ) අවධි විභක්තිය
(ආ) සම්ප්‍රදාන විභක්තිය

v. (අ) අනු + අරුත් පරස්වර ලෝප සන්ධිය
(ආ) නාරන් + මල පරරූප සන්ධිය

vi. (අ) මිනිසුන් රට පිළිබඳ නොසිතන්නේ ඇයි?
(ආ) ගුරුවරු නොහොත් අධ්‍යාපනඥයෝ රටේ අධ්‍යාපනය කටයුතු නඟා සිටුවති.

vii. අනඟි බිම, කලණ මිතුරු
අනර්ඝ භූමිය , කල්‍යාණ මිත්‍ර

viii. (අ) දෙගිඩියාව (ආ) අරපිරිමැස්ම

ix. (අ) වී මැනීමට භාවිත කරන උපකරණය
(ආ) විශාල ගස් දුවී ගිය තැන්

x. (අ) ඔවුන් විසින් අප පිනවමින් ගීත ගයන ලදහ / ලද්දෝ ය.
(ආ) දූරියක් මවක පෝෂණය කරයි. (ලකුණු 2 X 10 = 20 යි)

(02) (අ) සාරධර්ම ගුණධර්ම සපිරි සමාජයක් බිහි කරමු.
යහපත් ගුණධර්ම හා පිරිහී යන සමාජය
යහපත් සමාජයක් ඇති කිරීමට සාරධර්ම වපුරමු.

(ආ) කොරෝනා රෝගය පැතිරීම හා මිනිස් ක්‍රියාකාරකම්.
ජාතියක් ලෙස නැගී සිටිමින් කොරෝනා පලවා හැරීම.
කොරෝනා මර්දනය සඳහා ශ්‍රී ලංකාව ගෙනගිය වැඩපිළිවෙළ අගයමු.

(ඉ) විශ්ව විද්‍යාල අධ්‍යාපනය හා අනාගත පරපුර
නිදහස් අධ්‍යාපනයෙන් නිසි ප්‍රයෝජන ගැනීම.
විශ්ව විද්‍යාල සිසුන්ගේ ක්‍රියා කලාපයන් වෙනස් කිරීම.

(ඊ) සංචාරක ව්‍යාපාරය හා ශ්‍රී ලංකාවේ ආර්ථිකය
සංචාරකයින්ගේ පැමිණීම වර්ධනයට කටයුතු කිරීම.

ලකුණු 25
සාරවත් බව, මාතෘකාව ද ඇතුළුව 08
සංවිධානය නිර්මාණාත්මකභාවය
හා ස්වීයත්වය 12
ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදීම් 05

(ලකුණු 25)

(03) සාරාංශය අන්තර්ගතය

- නිර්මාණකරුවන් අත්දැකීම් ප්‍රකාශ කිරීමට ධ්වනිතාර්ථවත් භාවික ගුණයෙන් යුතු භාෂාවක් භාවිත කිරීම.
- පද්‍යයක සාර්ථක අසාර්ථක බව රඳා පවතින්නේ භාෂාව නිසා සුපරීක්ෂාකාරීව කවියා වචන තෝරා ගනී.
- භාෂාව හීන වුවද ශිල්පීය ලක්ෂණ අනුව කෘතිය අගය වේ.
- පද්‍යයක අත්දැකීමට වචන අනුව ප්‍රවේශ විය හැකිය.
- සෙසු මාධ්‍යවලට වඩා කවියට භාෂාව වැදගත් වේ.
- ඒ සඳහා පැරණි කාව්‍ය භාෂාව කෙරෙහි අවධානය යොමු වේ.

(මුළු ලකුණු 10)
අන්තර්ගතය 06
වචන ගණන 02
ශිල්පීය දක්ෂතා 02
10

(04) i. කිසිවෙකු විසින් කිසියම් අදහසක් අන්‍යයන්ට දැනුම් දීම.
ii. යම් යම් ප්‍රකට ස්ථානවල සලකුණු සටහන් කිරීම.
iii. භේරි සංඥාවයි.
iv. හදිසි යුද්ධයක් හෝ ආක්‍රමණයක් ඇත සිටින්නෙකුට ඉක්මනින් දැන්වීමට
(මින් එක් කරුණක් වුවද සෑහේ)
v. මරණයක්, දානයක්, පිරිතක්, විවාහ මංගල්‍යයක් යන පිළිතුරු වලින් දෙකක්.

(ලකුණු 2 X 5 = 10)

(05) දැන්වීම 15 යි.

| | |
|---|---|
| ආකෘතිය | 05 |
| අන්තර්ගය | 07 |
| ශිල්පීය දක්ෂතා | 03 |
| | 15 යි. |

වාර්තාව 15 යි.

| | |
|---|---|
| ආකෘතිය | 03 |
| අන්තර්ගතය | 09 |
| ශිල්පීය දක්ෂතා | 03 |
| | 15 යි. |

(ලකුණු 15)

---

## III පත්‍රය

(01) i. (අ) 4 වන පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා
(ආ) වර්තමාන කතාව, අතීත කතාව, සමෝධානය

ii. (අ) ගිරා / සැළලිහිණි / පරෙවි / කෝකිල (ආ) සලාවත ජයපාල මැතිඳුන්

iii. (අ) නන්හය සෙන් සිටියෝ සිටි මතිනේ (ආ) අශ්වයෝ පිළිම මෙන් සිටීම.

iv. (අ) බබුන් පිළිබඳ තොරතුරු
(ආ) පුංචි මැණිකා බබුන් සොයා හිරගෙදර ගියවිට හිරපල්ලා මුදල් ඉල්ලූ අවස්ථාව

v. (අ) පිඬුසිඟා වැඩි රහතන් වහන්සේ (ආ) සද්ධර්මරත්නාවලිය

vi. (අ) ලෙන අතහැර යාම (ආ) මහාවංශය

vii. (අ) සින්දු කියන උණ පඳුර / රතු කිකිළි / රන්කිරිකට
(ආ) පුනරුත්පත්තිය හා තවත් කෙටි කතා

viii. (අ) චූලනී බ්‍රහ්මදත්ත රජුගේ පිරිස / සේනාව (ආ) කේවට්ට බමුණා

ix. (අ) විලක් විලක් පාසාම පිපුණු නෙළුම් මානෙල් හා සුදු නෙළුම්
(ආ) හංස සංදේශය

x. (අ) එළු සඳැස් ලකුණ (ආ) විද්‍යාචක්‍රවර්තී (ලකුණු 2 x 10 = 20)

(02) i. (අ) යුද්ධෝපාය පරාජය වී නැවත තමාගේ නුවරට යමු'යි චූලනී රජු කියූ අවස්ථාවේ කේවට්ට බමුණා මෙසේ කීම.
(ආ) ධර්ම යුද්ධයට සූදානම් වීම.

ii. (අ) මැනවින් පිපුණු දුනුකේ ගස් හා මල් පිපුණු මුරුත ගස් හැමතැනම ඇත. ඕලු මානෙල් එළ මානෙල් නෙළුම් පිරුණු ජලාශ්‍ර දක්නට ලැබීම.
(ආ) රතු කැට / ජලාශ්‍ර

iii. (අ) අඟුල්මල් සෙවීමට යන ගමනේ කොසොල් රජු දෙව්රම් වෙහෙරට ගිය විට බුදුන් වහන්සේ, දකුණත නගා මහරජ මේ අඟුල්මලැ යි' කී නිසා.

(ආ) ඒ වේලාවේ කොසොල් රජ බිය වී වෙවුලුවේ ය. අනෙක් මහජනතාව බිය වී කඩු පළඟ විසිකර ඒ ඒ දිශාවල පැනගොස් නුවරට ගොස් දොර වසා අගුල් දමා අට්ටාලයට නැග බලමින් සිටියෝ ය.

iv. (අ) සෙනේහය පිරී ගිය ඔබේ නයන නිල් පොකුණ

(ආ) තඹර පෙති හෙවත් නෙළුම් පෙති හා සුදු මානෙල් රේණු වැසි වැටී ඇත.

v. (අ) සුවඳ ඇති මල් පැළඳ නටන දිව්‍යාංගනාවන්ගේ රංග විලාසය දුටු විට

(ආ) නොමිඳුණු, හිස මුදුන

(ලකුණු 4 x 5 = 20)

(03) i. <u>දරුණු බවට</u>

අටවියට වැද අටවියෙන් වදනා තන්හි අටවියෙන් නික්මෙනා තන්හි දූ සිටැ
මිනිසුන් මරයි. පිළි ඈ කිසිත් නොගනියි......
හෙ හැම අරණෙහි හසර නැති කළෙ දරපලා යන්නාහු වල් යන්නාහු නැති.......
ඒ මඟ අඟුල් මල් සොරරකැ දරුණු ලෙහෙ මුඩු අත් ඇත්තේ යැ.......

<u>යහපත් බවට</u>

මුඩගර්භ වැ නොවැදිය හෙන මා ගමක් දුක කරුණායෙන් කම්පිත වූහු මා ආර්ය ජාතියේ පටන් ගෙන දූන සතක්හු දිවි නොගැලවී නම් ඒ සසින් ති ට දූ ගබට දූ සෙත් වෙයි......
දූන් අඟුල්මල් තෙරහු මෙත්සිත් පිළ ලදින් සස් කොට මිනිස්නට සෙත් කරති.

(ලකුණු 15)

නැතහොත්

ii. <u>ප්‍රාර්ථනා</u>

අඩසඳ මෝරන මැදියම් අහසින්....
දෑසේ කඳුලැලි පිසදා බලනෙමි.....
දෙදහස් පන්සිය වසරක් තිස්සේ.....

<u>රූපකාර්ථ හා සංකේත......</u>

දෑතේ කරගැට සිඹ සනසන්නට......
අඩ සඳ මෝරන මැදියම් අහසින්.....
දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල....

(ලකුණු 15)

නැතහොත්

(04)i. <u>සිංහබාහු</u>

මැණියනි කිව ඔබ බස් අසා......
නොපමාව යා යුතුය......
යන්ට දුන් මේ කාලෙ වේ......
මැණියන් හා නඟණි සමඟින්......
තුමුල ගතින් - බාහු බෙලෙන්දා......

<u>සිංහයා</u>

මා සොඳුර මා සොඳුර......
සිංහ සීවලී මා ප්‍රිය දියණිය......
විසුවා ම සමඟ ආලයෙනා......
දරු රුවන් දෙදෙනෙකු දී......
නොදනිති හසරක් නුපුරුදු එ තිදෙන......

<u>නැතහොත්</u>

<u>අවස්ථා නිරූපණයක්</u>

නිලතුරඟට නැඟෙමින් රිවි දෙව් සිරින......
අයිරාවණා වුවත් නවතන රිසින් එන......
මල් දම් සුවඳ දුම් දුන් සොඳ වරලසිනි......

<u>උචිත කාව්‍ය උපක්‍රම</u>

වලඳින අදහසින් මෙන් සුරගඟ අඟන.......
අනුප්‍රාස උපමා, එළිසමය උත්ප්‍රේක්ෂාලංකාර......
රිවිතැවුලේ පිපි කමලේ විල් ගැවසී.....
වාග්චිත්‍ර මැවෙන සංකල්ප රූප......

<u>ශබ්ද රසය</u>

වනසිරි පියුම්රා බඳ රන බරණ යුරු
උපමා ස්වභාවෝක්ති

| | |
|---|---|
| උදාහරණ සඳහා ලකුණු | 04 |
| කරුණු සඳහා ලකුණු | 11 |
| | 15 |

(ලකුණු 15)

(05) "ස්වල්ප දෙනෙකුගේ ප්‍රිය සමාගමය සඳහා ම වෙන් කරන ලද සුගන්ධවත් සුන්දර අගාර ද සිතින් මවා ගත් ඇ ඒ පිළිබඳ කල්පනාවෙන් මනෝ ලෝකයක ජීවත් වූවා ය.

තම සාර්ථකත්වයත් රූප සෞන්දර්යයත් පිළිබඳ අභිමානයෙන් අන් කිසිවක් ගැන කල්පනාවක් නොමැති ව ආනන්ද ප්‍රවාහයක ගිලෙමින් හර්ෂෝන්මාදයෙන් නැටුවා ය.

ගේදරදාදොරක පවත්නා බර වැඩ කටයුතු ගැන ද මුළුතැන්ගෙයක පීඩාකාරී වෙහෙසකර වැඩ පළ ගැන ද ඇය තුළ අවබෝධයක් ඇති වූයේ ය.

මේ වන විට ලොයිසල් මහත්මිය මහලු පෙනුමකින් යුතුව සිටියා ය. ඇ දිළිඳු ගෙවල වසන අනෙක් ස්ත්‍රීන් මෙන් හැඩි දැඩි, ශක්තිමත්, ගොරෝසු දරදඬු ස්ත්‍රියක් බවට පත්ව සිටියා ය.

(ලකුණු 10)



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංවර්ධන අංශය

(06) <u>පිරුළු භාවිතය</u>

හානා හීය පානා අඬහැරෙන් දූනේ
යුධ ඇති දා නැති කග කොස් කොටන්නද....
දුවන මුවන් දුක නොදමන් නෙළුව පලා.....

<u>උපමා</u> - එක් උන දාට උක් දණ්ඩෙ පැණි සේමා....
ගැමියන් අතර පවතින සිදුවීම්
ගසට කෙටුම ගස මුල පැයුමෙන් දූනේ
රන්විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
අඳුරු කලුවරේ පඳුරට මුවා වෙලා (ලකුණු 10)

(07) නිදහස මහ මුහුදක් වේ......
ජාතික රණ දෙරණ මතේ......
තමන් ලැබූ දිවිපෙවෙතේ......
ජාතිය රන් විමනක් වේ......

උදාහරණ සඳහා ලකුණු 03
කරුණු සඳහා ලකුණු 07 (ලකුණු 10)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංවර්ධන අංශය